# සිංහල පද්‍ය සම්ප්‍රදාය හා ජනකාව්‍ය සම්ප්‍රදායෙන් පෝෂණය වූ කෝට්ටේ යුගයේ සිංහල පද්‍ය සාහිත්‍යය

- බෝලියද්දේ ධම්මකුසල හිමි

## හැඳින්වීම

අනුරාධපුර යුගයෙන් ආරම්භව ශතවර්ෂ ගණනාවක් මුළුල්ලේ අඛණ්ඩව පැවත එන පැරණි සිංහල කාව්‍ය සම්ප්‍රදාය තුළ ජනකාව්‍ය සම්ප්‍රදාය හා විදග්ධ හෙවත් සම්භාව්‍ය පද්‍ය සම්ප්‍රදාය යනුවෙන් පද්‍ය සම්ප්‍රදායන් දෙකක් පැහැදිලි ලෙසම හඳුනාගත හැකිය. මෙම සම්ප්‍රදායන් දෙක අතුරින් ජනකාව්‍ය සම්ප්‍රදාය වඩාත් පැරණි හා පොදුජන ජීවිතය සමග බැඳී පැවත එන්නකි. පොදු ජනතාව විවිධ අවස්ථාවන්හි දී සිය කාව්‍යාත්මක හැඟීම් ප්‍රකාශ කිරීමට යොදාගන්නා ලද පොදු මාධ්‍යයක් ලෙස ජනකාව්‍ය කෙටියෙන් හැඳින්විය හැකිය. ජනශ්‍රැතියේ එක් ප්‍රධාන අධ්‍යයන ක්ෂේත්‍රයක් වන එය ජනජීවිතය ඇසුරින් උපත ලබන කාව්‍ය වෙයි. මානවයාගේ අභිචාර විධි, රැකීරක්ෂා, ගමනාගමන, විනෝදාංශ ආදිය ඇසුරින් ජනිත වී ඇති ජනජීවිතයේ විවිධ අංශ ආශ්‍රිත නිර්මාණ ජනශ්‍රැතියට අයත් වේ.[1] ජනශ්‍රැතියට අයත් මෙම විවිධාංග අතර ජනකවිය ප්‍රධානතම අංගයයි.

සමාජයක ඉතා ඈත කාලයේ පටන් පැවත එන පුරාණම කාව්‍ය හැටියට ජනකවි සම්භාවිතය. සාමාන්‍ය ජනයාගේ දිවිය හා සම්බන්ධ ජනකවිය ඔවුන්ගේ දිවියේ අනේක විධ දුක්කම්කටොළු, සෙනෙහස, විරහව, ආදරය වැනි හැඟීම් ප්‍රකාශනය සමග අත්‍යන්තයෙන් බැඳී පවතියි. පොදු ජනජීවිතයේ අව්‍යාජ හැඟීම් ඇති සැටියට පැහැදිලි ලෙස ප්‍රකාශ කිරීම සඳහා ජනකවිය උපයෝගී කොට ගනියි. ජනසංස්කෘතියේ ඉහළ

වටිනා කමක් ඇති ජනකවි ආභාසයෙන් සාහිත්‍යකාරුවන් කලින් කල පද්‍ය රචනා කරන්නේ නොවෙනස් වන එම වටිනාකම මෙම කාව්‍ය තුළ තහවුරු වී ඇති බැවිනැයි සැලකිය හැකිය.

සම්භාව්‍ය කාව්‍ය හා ජනකාව්‍යසම්ප්‍රදායන් දෙකම වස්තු විෂය, භාෂාව, රචනා ශෛලිය, විරිත, පදමාලාව අදී සෑම අංශයකින්ම එකිනෙකට අන්‍යවූ ලක්ෂණයන්ගෙන් යුක්ත ය. මේ සියල්ල සකස් කර ගැනීමේදී සංස්කෘත ආලංකාරිකයන්ගේ කාව්‍ය විචාර සංකල්පයන්ගේ බලපෑම ආරම්භක යුගයේ සිට සම්භාව්‍ය සිංහල පද්‍ය සම්ප්‍රදායේ විද්‍යමාන මුඛ්‍ය කල්ෂණයකි. එසේ වුවත් ඇතැම් සාහිත්‍ය යුගයන්වල දී සම්භාව්‍ය සිංහල කවිය ජනකාව්‍ය සම්ප්‍රදායේ ආභාසය ලබමින් ජනයාට වඩාත් සමීප වූ අවස්ථා ද හඳුනාගත හැකිය. ජනකාව්‍යයෙන් හා ජනවහරින් සිංහල සාහිත්‍යය පෝෂණය ලැබූ එවැනි එක් යුගයක් ලෙස කෝට්ටේ යුගය සිංහල සාහිත්‍ය වංශය තුළ හඳුනා ගැනෙයි. ඒ අනුව සිංහල පද්‍ය සම්ප්‍රදාය දෙසට අවධානය යොමු කරමින් ජනකාව්‍ය සම්ප්‍රදායේ ආභාසය ලද කෝට්ටේ යුගයේ සිංහල පද්‍ය සාහිත්‍යය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම ලිපියේ මූලික අරමුණ වේ.

## ප්‍රවේශය

ජනකවිවල ඉතිහාසය ඉතා පැරණිතම ශිෂ්ටාචාර දක්වා පැතිරී ඇත. පුරාණ භාරතයෙහි ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පදනම් කොට පැතිරුණු වෛදික ඍග් ගීත පවා ජනකවිවලින් ආභාසය ලබා ඇති බව පෙනේ. පුරාණ භාරතයට පමණක් නොව ලොව පෙරපර දෙදිග ජාතීන්ටම ආවේණික සාහිත්‍ය අංගයක් ලෙස ජනකවිය හැඳින් විය හැකිය. ඒවායේ ආරම්භය ක්‍රි. පූ. 1500දී පමණ සිදුවූයේ යැයි විශ්වාස කෙරේ. බෞද්ධ සාහිත්‍යයේ සූත්ත නිපාතයේ ථේර ථේරීගාථාවල එන සමහර ගාථාවන් ජන ජීවිත විවරණ හැටියට ප්‍රමාණවත් අගයකින් පිරී තිබේ. යම් යම් දෙනාගේ පෞද්ගලික ජීවිතයේ තොරතුරු නිර්ව්‍යාජ ලෙස කියා පෑමට දිරි දරා ඇති මේ ගාථාවන් ද ආභාසය ලබා ඇත්තේ ජනකවි සම්ප්‍රදායෙන් යැයි සිතිය හැකිය.



ජාතික සංස්කෘතියට, සභ්‍යත්වයට හා ගැම්බසට ආලෝකයක් වූ ජනකවිය පැරණි ගැමියා අතර පැවති නානා දේ පිළිබඳ තොරතුරු අනාවරණය කෙරෙන මූලාශ්‍රයක් විය.[2] ගැමියාගේ සිත් සතන් තුළ ජනිතවූ නිදහස් අදහස් හා සිතුම්පැතුම් අව්‍යාජව හා සරලව ඉදිරිපත් කරන මෙම කවි පැල් කවි, කමත් කවි, ගොයම් කවි, නෙළුම් කවි, කුරහන් කවි, කරත්ත කවි, පාරු කවි, වාරම් කවි, දොළොස් මහේ සිව් පද, වැදි ගී, මල් ගී, ආදී වශයෙන් විවිධ අංගයන්ගෙන් සමන්විත වේ.[3] සිංහල ජනකවියේ පුරාවෘත්තය ද ඉතා දීර්ඝ වූවකි.[4] එහි ආරම්භය නිශ්චිතව කිව නොහැකි වුවත් සිංහල ජනකවිය පිළිබඳ ඉපැරණි ප්‍රවෘත්තියක් බුද්ධඝෝෂ හිමියන් විසින් ලියන ලද පාලි අටුවාවක් වූ 'සාරත්ථප්පකාසිනී' ග්‍රන්ථයෙහි සඳහන් වේ. එහි ඇල්ගෙවිලියන් විසින් ජාති, ජරා, මරණ යන ත්‍රිලක්ෂණය ප්‍රකාශ කරන ලද ගීතයක් ගායනා කරනු අසා සිටි සැටනමක් භික්ෂූන් රහත්වූ බව කියැවෙයි.[5] මෙය සිංහල කාව්‍ය ග්‍රන්ථ රචනා කිරීමට පෙර කාලයේ පැවතිජනකවි කීමේ ප්‍රවෘත්තියක් විය හැකිය.[6] සිංහල ජනකවියේ ආරම්භය ඈත අතීතයට දිවයන බැවින් සිංහල කවියේ ආරම්භය සෙවීම තරමක් අසීරු කරුණක් ද වේ. ලක්දිව සම්භාව්‍ය පද්‍ය සම්ප්‍රදාය ආරම්භ වීමට බොහෝ කලකට පෙර සිට ජනකාව්‍ය සම්ප්‍රදාය ජනයා අතර පැවති බවට තොරතුරු අධ්‍යයනය කළ හැකිය. එබැවින් සිංහල පද්‍ය සම්ප්‍රදායේ ආරම්භය පිළිබඳව කෙරෙන අධ්‍යයනයේ දී මූලික අවධානය ජනකවි සම්ප්‍රදාය දෙසට යොමු කිරීමට සිදු වෙයි.

## ජනකාව්‍යයෙහි ලක්ෂණ

ජනකවියෙහි ඇති විශේෂ ලක්ෂණයක් නම් කතුවරයෙකු නොමැතිවීම යි. උගත් කවියෙකු අතින් සම්පාදනයවූ කාව්‍යයක මෙන් ජනකවිය රචනා කරන ලද ලේඛකයකු ගැන සඳහන් නොවේ. එයට හේතුව ජනකවිය පහළ වන්නේ ජනතාව තුළින් වීම යි.[7] ජනකවියෙහි ලක්ෂණ විභාගයේදී සැලකිල්ල යොමු කරන කරුණු කීපයක්ම ඇත. පැහැදිලි හා සරල සන්දර්භයකින් රචනා කිරීම මූලික ලක්ෂණයකි. මීට අමතරව කතා කරන බස යොදා ගැනීම හා ශාස්ත්‍රීය නීතිරීති ගරු නොකිරීම ජනකවියෙහි

විශේෂ ලක්ෂණයෝ වෙති. නිර්ව්‍යාජභාවය හා සංයමයද සංක්ෂිප්තභාවය ද ජනකවියේ පැහැදිලිව හඳුනා ගත හැකි ලක්ෂණවලින් කිහිපයකි. මෙම නිර්ව්‍යාජභාවය හා සංයමය ජන කවීන් යොදන වචන හා උපමා රූපකවලින් ප්‍රමණක් නොව ඔවුන්ගේ රිද්ම රටාවලින්ද මොනවට පෙනී යයි.[8] ඒ අනුව ජන කවිය විදග්ධ කවියෙන් වෙනස් වන ප්‍රධාන සාධක කීපයක් දැකිය හැකි ය. එනම්,

- නිශ්චිත කතුවරයෙකු නොමැති වීම
- සම්භාව්‍ය කාව්‍ය ලක්ෂණයන්ගෙන් තොර වීම
- පැහැදිලි හා සරල සන්දර්භය
- නිර්ව්‍යාජභාවය හා සංයමය
- සංක්ෂිප්ත භාවය
- අවස්ථාව ආශ්‍රිතව ම නිරායාසයෙන් නිර්මාණය වූ බව
- කථා ව්‍යවහාරයට සමීප වීම

ජනකවියා තත්කාලීන සමාජයෙහි වාසය කළ සාමාන්‍ය ජනතාවගේ ජීවිතය සිය නිර්මාණයන් සඳහා පදනම් කොට ගත්තේය. ඊට එදිනදා ජීවිතයට අදාළ අත්දැකීම් වස්තු කොට ගැනිණි. ජීවිතයේ දුක කියාපාන කවි මෙන්ම සතුට ප්‍රීතිය කියා පාන කවි ද ජනකවි අතර සුලභය. දුක්කම්කටොලු ගැන සඳහන් කොට කරුණා රසයක් ඇති කිරීමටත් ප්‍රීතිය සතුට ගැන සඳහන් කොට ශෘංගාරය, හාස්‍ය රස ඇති කිරීමටත් ජන කවියා සර්ව ශුභවාදී හෝ සර්ව අශුභවාදී හෝ දෘෂ්ටියක පිහිටා සිටි කෙනෙකු නොවේ. බුදු සමයේ බලපෑමෙන් දෝ ඔහු මධ්‍යම ප්‍රතිපදාව පදනම් කොටගත් ජීවන දර්ශනයක පිහිටි කෙනෙකි. කවර අද්දැකීමක් වුවද සංවර බවකින් හා සංයමයකින් පළ කිරීමට ඔහු සමත් වේ.

සම්භාව්‍ය කාව්‍ය ගතහොත් එහි දක්නා ලැබෙන්නේ සංස්කෘත කාව්‍යයන්ට පසුබිම්වූ සමාජය පරිසරයයි.එහෙත් ජනකවියා අපේ මුතුන් මිත්තන්ගේ ජීවිතය, මෙරට පරිසරය



වස්තු කර ගත්තේ ය. එනිසා ජනකවියා ස්වාභාවික සෞන්දර්යයෙන් මහත් ආස්වාදයක් ලත් කෙනෙකු වූ අතර සිංහල ගැමි ජීවිතයේ ජීවන සුවඳ ජනකවියට පිවිසුණේ ය.[9] සිය පද්‍ය සඳහා ජනකවියා උපයෝගී කොටගත් බස ලිහිල්, ප්‍රාණවත් භාෂා විලාසයක් ලෙස සැලකිය හැකිය.

සම්භව්‍ය කාව්‍ය සම්ප්‍රදායට අනුව බලන කෙනෙකුට පුනරුක්තිය වැනි ඇතැම් කාව්‍ය දෝෂ කාව්‍ය දුර්වලතාවන් ලෙස උසස් කාව්‍යයේ දී සැලකේ. එහෙත් ජනකාව්‍යයෙහි එය වැදගත් ලක්ෂණයක් හැටියට පවතින බවඅධ්‍යයනය කළ හැකිය[10]

## ජනකාව්‍ය සම්ප්‍රදාය හා සිංහල පද්‍ය සාහිත්‍යය

සිංහල ලේඛන පිළිබඳ සටහන් ඇති මුල් අවධියේ සිටම දක්නා ලැබෙන පද්‍ය කරණයෙහි දියුණු යුගය ක්‍රි. ව. 6 වන සියවසෙහි පළමු වන අග්බෝ රජු සමයෙහි කැපී පෙනෙයි.[11] අග්බෝ රාජ්‍ය සමයෙහි දෙළොස් මහා කවීන් විසූ බව සඳහන් වේ. සක්ද මල, අසක්ද මල, දමී, බැබිරී, දළ බිසෝ, අනුරුත් කුමරු, පුවරඩු කුමරු, සූර්යබාහු සහ කසුප්තොට ඇපා යනාදීහු එකළ විසූ ශ්‍රේෂ්ඨ කවියෝ ය. මේ කවීන් විසින් අසක්දකව වැනි කාව්‍ය ග්‍රන්ථ රචනා කරන ලද බව සඳහන් වේ.[12] මෙයින් පැහැදිලි වන්නේ ආරම්භක යුගයේ සිටමකවිය සමාජයෙහි ප්‍රචලිතව පැවති සාහිත්‍යංගයක්වූ බවයි.

අනුරාධපුර යුගයේ මුල් කාලපරිච්ඡේදයේ සිටම සිංහල පද්‍ය සාහිත්‍යය ඉතා උසස් මට්ටමක තිබුණු බව පෙනේ. සීගිරි පද්‍ය රචනාවන අවධිය වන විට ඡන්දස් ශාස්ත්‍රය හා සාහිත්‍ය විචාර වාද ගැන ලියවුණු සංස්කෘත සාහිත්‍යය සිංහල ලේඛකයන් කෙරෙහි බල පෑ බව සීගිරි කැටපත් පවුරෙහි ලියා තිබෙන පද්‍යවලින් පැහැදිලි වේ.[13] විශේෂයෙන් සියබස්ලකර රචනා වීමෙන් පසු ඒ අනුව යමින් සිංහල පද්‍ය හැඩ ගැසුණු බව අධ්‍යයනය කළ හැකි වුවත් සියබස්ලකරට පෙර සිට සිංහල

ඡන්දස් ග්‍රන්ථ මෙරට පැවති බව සියබස් ලකර කතුවරයාමසිය කෘතියේ අවධාරණය කරයි.

''කලා ගුරු සුළු පා - වැසි වූ කුලුණු නුවණ යුත්
කලන මිතේ වියතුන් - ගත්හි පියුම් ලකුණු ඈ''[14]

මීට අමතරව පූර්වයේ සිංහල ඡන්දස් ග්‍රන්ථයක් තිබූ බව ''පොරණ ඇජුරන් ගිය ඇලුප් මගින්'' යනුවෙන් එළු සඳැස් ලකුණ කතුවරයා කරන ප්‍රකාශයෙන්ද පැහැදිලි වේ. ග්‍රන්ථාගත තොරතුරු මගින් හෙළිවන මෙමඡන්දස් ග්‍රන්ථ පිළිබඳව නිශ්චිතව කිව නොහැකි වුවත් සංස්කෘත විචාර ග්‍රන්ථ අනුව යමින් රචිත කාව්‍ය විචාර ග්‍රන්ථ ද, එසේම එකල ප්‍රචලිතව පැවති දේශීය කාව්‍ය සම්ප්‍රදාය පදනම් කරගත් විචාර ග්‍රන්ථද ඒ අතර තිබෙන්නට ඇත. සියබස්ලකර රචනා කරීමට පෙර රචනා කරන ලද සීගිරි පද්‍ය අධ්‍යයනය කිරීමෙන් මෙම කාව්‍ය සම්ප්‍රදායන් දෙකම අනුරාධපුර මුල් අවධියේ පැවති බවට කරුණු අධ්‍යයනය කළ හැකිය.

සංස්කෘත ආලංකාරිකයන්ගේ බලපෑම සිංහල සීගිරි පද්‍ය තුළ බොහෝ සෙයින් දැකිය හැකි වුවද ව්‍යවහාර භාෂාව තුළින් පැන නැගුණු සජීවී රිද්මයක් සහිත දේශීය ලක්ෂණ රැගත් කාව්‍ය සම්ප්‍රදායක්ද සීගිරි පද්‍ය තුළින් හමු වෙයි. සංස්කෘත කවි සමයෙහි බලපෑම ආරම්භ වූයේ මෙම ස්වාධීන කාව්‍ය සම්ප්‍රදාය මෙරටෙහි වැඩෙමින් පැවති අවධියෙහි විය යුතු ය.[15] අසක්දා කවෙන් ස්වර්ණමය අවධිය වෙත ළංව ඉක්බිතිව ක්‍රමයෙන් අභාවයට ගිය දේශීය කාව්‍ය සම්ප්‍රදායක් ලෙස සීගිරි ගී හඳුනා ගත හැකි බව ප්‍රකාශ කරන ගුණදාස අමරසේකර දේශීය කාව්‍ය සම්ප්‍රදායේ හරය මෙන්ම ඒ දේශීය සම්ප්‍රදායේ පරිහානිය ද සීගිරි ගීවලින් දැකිය හැකි බව එතුමාගේ අදහසයි.[16] ඈත අතීතයේ සිට පැවත එනජනකාව්‍යජනයා අතර ප්‍රචලිතව පැවති අතර එහි බලපෑමෙන් සීගිරි පද්‍ය තුළට මෙම ලක්ෂණ පිවිසෙන්නට ඇතැයි ඇතමෙක් විශ්වාස කරති. ඔවුන් විසින් සීගිරි ගී හඳුන්වනු ලබන්නේ සීගිරි ගී ජනකවි ලෙසට ය. එසේ සීගිරි පද්‍ය සියල්ලම ජනකවි ලෙස හැඳින්වීමට ඇති ඉඩකඩ ඉතා



අල්පය. සීගිරි පද්‍ය අතර වැඩි කොටසක් රස භාව පූර්ණ ඉතා උසස් උගත් කවීන්ගේ කවි විනා ජනකවියන් විසින්ම රචනා කරන ලද කවි යැයි පිළිගැනීම දුෂ්කර ය. එහෙත් ඒ පද්‍ය අතර ඉතා ස්වල්පයක් ජනකවි ආභාසය ද ලබා ඇති බව සැලකිය හැකි ය. වස්තුවිෂය, උපමා භාවිතය ආදී අංශයන්ගෙන් බලන විට ස්වධීන සිංහල පද්‍ය සම්ප්‍රදායක තොරතුරු සීගිරි පද්‍ය සාහිත්‍යයෙන් සොයා ගැනීමට අසීරු නොවේ. විශේෂයෙන් සීගිරි පද්‍යවල එන බොහෝ වචන, උපමා හා ප්‍රකාශන භාෂණයෙන්ම උපුටාගත් ඒවා බවපෙනෙයි. එම ලක්ෂණ ජනකාව්‍ය සම්ප්‍රදායේ ලක්ෂණ සමග මනා ලෙස ගැළපෙයි.

සීගිරි පද්‍ය සඳහා ජනකාව්‍යයේ ආභාසය ලැබීම අරුමයක්ද නොවේ. සීගිරි කැටපත්පවුරේ ගී සටහන් කළෝ උගත්තුම නොවෙති.[17] සීගිරිය නැරඹීමට පැමිණි බොහෝ ජනයා විවිධ තරාතිරම්වලට අයත් වූ අතරනන්දෙසින් පැමිණි පිරිස් වූහ. එසේ පැමිණි අය අතර ජීවිත පරිඥානය ලත් ගැමි ජීවිතය නියම අයුරින් දුටුවෝ ද ස්වාභාවික සෞන්දර්ය ආශ්වාදය විඳීමට සමත් වූවෝ ද වූහ. ගල මතට නැග අවට නැරඹූ ඔවූහු ස්වාභාවික පරිසරයෙන් මත්ව ගලා ආ අදහස්, සීගිරි ළඳුන් දැකීමෙන් සිතෙහි හටගත් රසාලිප්ත හැඟීම් ආදී නොයෙක් දෑ නිදහස්ව හා නිවහල්ව සීගිරි කැටපත් පවුරෙහි සටහන් කොට තැබූහ.[18]

''කොමුල් අමඩ්ලෙඩ් ලින සී
එබොන්ද මියුර් යහ බැසී
එ කපල්දල වත් දිගැසී
මනජල්වයි සිත් නො මුසී''[19]

(ඇගේ කෝමල සිනහව කොමඩු ගෙඩියක බීජ පන්ති
මෙනි. ඇගේ යහපත් වචන එහි මදය මෙන් මිහිරිය.
ඇගේ දිගු ඇස එහි පිට පොත්ත මෙන් දෙපසින් සිහින්
වී යයි. එබඳු තැනැත්තිය මා හද දල්වයි. මා සිත ඈ
කෙරෙන් නොමුදයි.)

සීගිරි කාන්තාවගේ සිනහවගැන සඳහන් කිරීමටඑදිනදා දක්නට ලැබෙන කා විසිනුත් රස විඳිනු ලබන කැකිරි ගෙඩියක ඇට මෙනැයි කිමෙන් දේශීය වූ උපමාවක් ගෙන මනහර චිත්‍රයක් මවයි. කැකිරි තීරුවක ලෙල්ලට ඇය සමකිරීමෙන් එහි වර්ණයත් හැඩයත් පිළිබඳව පාඨකයාට අවබෝධයක් ලබා දෙයි. ජනකවියේ දක්නට ලැබෙන ලක්ෂණ අතර ගැමි ජීවිතය ආශ්‍රයෙන් උපමා යොදා ගැනීම, ව්‍යවහාර භාෂාවට තැන දීම හා නිර්ව්‍යාජත්වය ආදී ලක්ෂණ මෙහි ගැබ්ව ඇත.[20] සියබස් ලකරට පෙර භාෂණයේ රිද්මයට වැදගත් තැනක් දුන් දේශීය පද්‍ය සම්ප්‍රදායක් නිසැකලෙසම මෙරට සංවර්ධනය වීපැවති බවට සීගිරි පද්‍ය සාක්ෂි දරයි. ඒවායින් විශාල සංඛ්‍යාවක් පොදු ජනයාගේ නිර්මාණ වීම ඊට ප්‍රධාන හේතුවකි.

උපමා රූපක භාවිතයෙන් මෙන්ම අදහස් ප්‍රකාශ කිරීමේදී යොදා ගන්නා උපක්‍රමඅතින් ද ඇතැම් සීගිරි පද්‍ය ජනකවියට ආසන්න වන සැටි නිදසුන් මගින් පෙන්වා දිය හැකිය. සීගිරි පද්‍යයන්හි එන ජනකවියා භාවිත කරන ලද 'උබබස්' නම් අලංකාරය මීට එක් නිදසුනකි. සංස්කෘත කාව්‍ය අලංකාරයන්හි දක්නට නොලැබෙන මෙම අලංකාරය සිදත්සඟරා කතුවරයා මෙලෙස හඳුන්වා දෙයි.

''උතුරුපසතුරු දෙන - දෙදෙනකු වදන්පිරියතැ
වැනි යටි සිරිත 'වෙසෙසක් - පළවතුබබස් නම් වේ''[21]

(උත්තරප්‍රත්‍යුත්තර දෙන්නාවූ උභයජනයක්හුගේ
වචනපර්යන්තයෙහි වර්ණනීයවූ චාරිත්‍රවිශේෂයක්
ප්‍රකාශකළ කල්හි උභය භාෂා නම් වේ)

දෙදෙනෙකු අතර ප්‍රත්‍යුත්තර වශයෙන් ඇතිවන්නා වූ කතා ප්‍රවෘතියක් ආකාරයෙන් පද්‍ය රචනා කිරීම 'උබබස්' නම් අලංකාරයේ ලක්ෂණ යයි. ගුණදාස අමරසේකර මහතා පෙන්වා දෙන්නේ උබබස් අලංකාරය ගී කාව්‍ය තුළදැක්ක හැකි ප්‍රධාන අලංකාරයක් බවයි.[22] ඈත අතීතයේ සිට නූතන යුගය දක්වා



සිංහල කවීන් අතර බෙහෙවින් ජනප්‍රිය වූ අලංකාරයක් ලෙස මෙය හඳුනාගත හැකිය.

''සිය පා සතෝ තෝ පාගා දමයි හෙට
පිය ගැට කුදෝ එය කීවේ කව්ද තට''

'ඔන්න කව්ද දෙරෙටුව ළඟ සිටින්නේ
චන්න මමයි දොරටුව ළඟ ස්වාමිනේ''[23]

'උබබස්'අලංකාරය සීගිරි පද්‍ය අතරද සුලබ ලෙසභාවිත වෙයි.

''හින්ද මෙ සිත් හෙජුයූ හිමම්බින් වී තබන් දනො
නො ජෙනී හෙජ් ගිය මා හින්දින්නො මින්දියො ''[24]

(බෙයදෙහි නැගි දනෝ මෙ දෙසෙ සිත්යොමා බලමින්
සිටිත්, සබඳිනි, මෙදෙස අසලින් අවුත් බලන්නේ නම්
තොපද යහපත් ප්‍රීතියට පත් වන්නාහුය.)

''සව බරණින් සැජි ගිරිහිසැ සිටිහි කුමට''[25]
(සියලු ආභරණයන්ගෙන් සැදී කඳු මුදුනෙහි සිටින්නේ
මන්ද? )

''මෙහිම සකි ඈ පියා මළ කිම ළපල්ලක් ගතු''[26] (මා යහලුව! ඇගේ පැරණි ප්‍රියයා මළේ වීනමුත් ඇය ළපල්ලක් ගෙන සිටින්නේ කිම?)

සීගිරි කවීන් සකු කවි සමය අනුව පද්‍ය රචනා කළද භාෂාව යොදා ගැනීමේ දී ජනකවියා මෙන්ම භාෂණයට මුල් තැන දුන් වචන බොහොමයක් යොදා ගනියි. විශේෂයෙන් 'උබබස්' අලංකාරයේ දී සීගිරි කවීන් භාෂණයට ප්‍රමුඛ තැන දී ඇත. විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කරන විට සීගිරි පද්‍ය මගින් දේශීය පද්‍ය සම්ප්‍රදායක ස්වාධීන ලක්ෂණ හඳුනාගත හැකිය..

ක්‍රි. ව 09 වන සියවසේ සියබස්ලකර නම් සිංහල කාව්‍ය විචාර ග්‍රන්ථය රචනා වීම සිංහල පද්‍ය සම්ප්‍රදායේ එක්

සන්ධිස්ථානයකි. සියබස්ලකර රචනා වීමෙන් සකු බසට හා සකු අලංකාරවලට උගතුන් දැක්වූ සැලකිල්ලවඩාත් හොඳින් පැහැදිලි වේ. එහි ප්‍රතිඵලයක් ලෙස සීගිරි ගී තුළ යම් පමණකට හෝ විද්‍යමානව පැවති දේශීය කාව්‍ය සම්ප්‍රදාය ක්‍රමයෙන් පිරිහී ගිය බව පෙනේ. ඉන්පසු කවීන් සංස්කෘත අලංකාරවාදය සඳහා කොතෙක් දුරට නැඹුරු වූයේද යන්න මුවදෙව්දාවත, සසදාවත හා කව්සිළුමිණ යන ගී කාව්‍ය මගින් පැහැදිලි වේ.ගී කාව්‍ය රචකයන් සංස්කෘත අලංකාරවාදය ගුරු කොට ගැන්ම නිසා ඒ කාව්‍යවලට ව්‍යාජත්වයක් ආරූඪ විය. සංස්කෘත කාව්‍ය ගුරුත්වයෙන් සැලකූ උගත්තුජනකාව්‍ය බැහැර කළ හ. ජනකාව්‍ය බැහැර කිරීම නිසා සිංහල කාව්‍ය නිතැතින් වැඩුණු දේශජ ලතාවකගේ ස්වරූපයෙන් නොවැඩිණු බව මාර්ටින් වික්‍රමසිංහ ප්‍රකාශ කරයි.[27] විශේෂයෙන් දේශීය කාව්‍ය සම්ප්‍රදාය සියබස්ලකර පහළ වීමෙන් පසු සංස්කෘත අලංකාරවාදයට ඉඩදී සහමුලින්ම යට වී ගියා පමණක් නොව සීගිරි පද්‍ය සාහිත්‍යයේ විද්‍යමාන වූ ස්වාධීනව වස්තු විෂය තෝරා ගැනීමට කවියා සතුව තිබූ නිදහස ද සීමා වනු පෙනේ. ඒ අනුව පද්‍ය සාහිත්‍ය කරුවා "පෙදෙන් බුදු සිරිත"[28] යන සියබස්ලකර නියමයට අනුව පද්‍ය කරණයේ නියුතු විය. ඔහුගේ අනිවාර්ය වස්තු විෂය වූයේ බුදු සිරිතය. මෙම කාව්‍ය සම්ප්‍රදාය දඹදෙණි යුගය දක්වා ක්‍රියාත්මක වන අයුරු දැකිය හැකිය.

සිංහල කවියන් අතර ජාතක කතා කවි කළ කවියන් මෙන්ම ඉන් බැහැර මාතෘකා කවිවලට යොදාගත් කවියන් ද තම කාව්‍යයන්හි තැනින් තැන නමුදු ඇතැම් ජනකාව්‍ය ලක්ෂණවලින් සරසා ලන්නට අමතක කර නැත. සිංහල පද්‍ය විකාශනයේදී මේ ස්වරූපය ගත් ප්‍රධානම යුගය වශයෙන් හැඳින් විය හැක්කේ 15 වැනි සිය වසින් ඇරඹුණු කෝට්ටේ යුගය යි.

> "...ගද්‍ය භාෂාව, පැරණි පණ්ඩිත ප්‍රිය ස්වරූපයෙන් ගිලිහීමෙන් ගැමියන්ගේ බසට හුරු ස්වරූපයක් ගැනීම නිසා, ජනකවියෙහි භාෂාවත් රීතියත් සන්දර්භයත් දඹදෙණි



> කාලයෙන් අනතුරුව පහළ වූ සිංහල කවීන්ගේ සැලකිල්ලට භාජනය විය."[29]

දඹදෙණි යුගයෙන් පසුව එළඹෙන කෝට්ටේ යුගයේ පද්‍ය සාහිත්‍යය බෙහෙවින්ම ජනප්‍රිය විය. ජන කාව්‍යයේ ආභාසයෙන් පොදු ජන කාව්‍යයක් නිර්මාණය වීම මීට ප්‍රධාන හේතුයි.[30] සියබස්ලකරින් නියම කරන ලද සීමාවෙන් එළියට ගමන් කරන කෝට්ටේ යුගයේ කවීහු ජනකාව්‍යයේ ආභාසය ලබමින්විවිධ වස්තු විෂයයන් ඔස්සේ ස්වධීන ලක්ෂණ සහිත පද්‍ය සාහිත්‍ය ප්‍රවර්ග රාශියක් නිර්මාණය කළහ. එය උගත් නූගත් සැමදෙනාට රස විඳිය හැකි පොදු ජනකාව්‍ය සම්ප්‍රදායකි.

කෝට්ටේ යුගයට අයත් පද්‍ය ද ඊට ටික කලකට පැරණි යැයි සමහරුන් සලකන සඳකිඳුරු දා කවද රීතිය බස් වහර හා පද මාලාව විසින් කොතෙක් දුරට ජනකවියට ළඟ සම්බන්ධකම් ඇත්තේ දැයි පරීක්ෂා කිරීම මෙම අධ්‍යයනයෙහි ලා ප්‍රයෝජනවත් ය. සඳකිදුරුදාකව දෙනගමුව විහාරයෙහි විසූ විල්ගම්මුල තෙරුන් විසින් රචනා කර ඇත. මෙය කුරුණෑගල යුගයේ දී රචනා වූ බවට අදහස් ඉදිරිපත් වුවද මේ සම්බන්ධව මත කීපයක් පවතී. හ්‍යු නෙවිල්, වලානේ ධම්මානන්ද, මකුළුවේ පියරතන වැනි වියත්හු මෙම කාව්‍යය කුරුණෑගල යුගයේ ලියවුණු කාව්‍යයක් සේ සලකති. නමුත් පුංචිබණ්ඩාර සන්නස්ගල ප්‍රකාශ කරන්නනේ සෙන්කඩගල (මහනුවර) රාජධානි යුගයේ රචනාවූ බවයි.[31] සඳකිදුරු දා කවේ කතුවරයා පිළිබඳ දීර්ඝ විස්තරයක් කරන ගුණදාස අමරසේකර මහතා විල්ගම්මුල හිමියන් විසින් සඳකඳුරු දා කව දඹදෙණි යුගයේ රචනා කරන ලද බව ප්‍රකාශ කරයි.[32] පොදු පිළිගැනීම අනුව මෙම පද්‍ය කාව්‍යය කුරුණෑගල යුගයේ දී හෝ දඹදෙණි යුගයේ දී එනම් කෝට්ටේ යුගයට පෙර රචනා වූ කෘතියක් ලෙස පිළිගන්නේ නම් කෝට්ටේ යුගයේ බිහිවන පොදු ජනකාව්‍ය සම්ප්‍රදායෙහි ආරම්භය ඊට පෙර සිට සිදුවූ බව තරවුරු කිරීමට එය ප්‍රබල සාධකයක් වෙයි. නමුත් භාෂාවට හා ශෛලියට අනුව මේ කෘතිය දහසයවන හෝ දහහත්වන සියවසට අයත් කළ හැකි බව ඇතැම් විද්වතුන්ගේ අදහසයි.[33] මේ මතය බොහෝ විද්වතුන්ගේ

පිළිගැනීමට ද ලක්වේ.[34] කෙසේ වුවත් සියබස්ලකරට සීමා නොවී ස්වාධීනව පද්‍ය රචනා කිරීමට සිංහල පද්‍ය රචකයන් ආරම්භ කරන ලද්දේ ඊට පෙර යුගයේ එනම් ගම්පොළ යුගයේ සිට බව අධ්‍යයනය කළ හැකිය. ඊට ප්‍රධානම සාධකය වන්නේ කෝට්ටේ යුගයේ විශිෂ්ට සාහිත්‍ය ප්‍රවර්ගයක් ලෙස දියුණු වන සන්දේශ කාව්‍ය ගම්පොළ යුගයේ ආරම්භ වීමයි.[35] ඒ අනුව කෝට්ටේ යුගයේ පොදු ජනයාට සමීප පද්‍ය සම්ප්‍රදායේ ආරම්භක අවස්ථාව දඹදෙණි යුගයෙන් පසු ආරම්භ වන බව පිළිගත හැකිය. කෝට්ටේ පද්‍ය වියත් කාව්‍යයට මුල් තැන දෙමින් රචිත බව සැබවි. එහෙත් ජනකවි මග එකල කවීන් කෙරෙහි කිසියම් ප්‍රමාණයකට බලපා ඇත. කෝට්ටේ යුගයේ අවසාන කාලයේ කවීන් ජනකවිමඟ ළඟින්ම අසුරු කළ බවට වයන්ති මාලයෙන් පෙනෙයි.[36]

ජනකාව්‍ය සම්ප්‍රදාය අනුව රචනා කෙරෙන සඳකිඳුරු දා කව සිව්පද ආකෘතියෙන්, සරල බස්වහරක් යොදාගෙන රචනා කෙරෙයි. මෙම පද්‍යට වස්තු විෂය වන්නේ චන්දකින්නර ජාතකයෙහි එන බෝධිසත්වයන්ගේ ප්‍රිය භාර්යාව වූ යශෝදරාව පෙර අත්බවෙක කිඳුරියක ලෙස උපන් කතා පුවතය. සඳකිඳුරුදාකව යනුවෙන් හැඳින්වෙන මෙහි සිංහල පද්‍ය කාව්‍යයෙහි එන විශිෂ්ට භාවගීත ඇතුළත් වෙයි.[37] මෙම කවියා ගැමි උපමා භාවිතය හා භාෂණය සරලව හා සියුම්ව පැදියට යොදා ගෙන තිබෙන ආකාරයෙන් සඳකිඳුරු දා කව ජනකවියට කොතරම් සමීපදැයි අවබෝධ වේ. කවියා සතු වදන් පවා කටට හුරු ලෙසට සකසා ගනිමින් භාවිත කරයි

''සඳකිඳුරු ජම්මෙක
ඉපිද හිමවත් පෙදෙසක''[38]

පද වැල හා බස් වහර පමණක් නොව කවියාගේ පද්‍ය රචනා රීතිය ජනකවියට කෙතරම් නම් ළඟ සබඳකම් කියා ද යනු පහත සඳහන් පද්‍ය නිර්මාණයන්ගෙන් පැහැදිලි වන්නකි.



''මෙ බඳු දුකකුත් වන
කෙනෙකුත් නැත පිහිට වන
දෙකක්කෙරෙමින් වන
අඬා වන සෝ කියන්නට වන''[39]

''කන්නලවු නොයෙකී
කීවා කනක වැකී
තිරිසන් වූ එකී
පැතූ ඒ මම ද තිරිසනෙකි''[40]

කෝට්ටේ යුගයේ පද්‍ය සාහිත්‍ය ග්‍රන්ථ අතර සිව් පද, ගී, සිලෝ යන කාව්‍ය ආකෘති විද්‍යමාන වන අතර ජනකවියා අනුව ගිය කෝට්ටේ යුගයේ කවියන් බහුල වශයෙන් සිව්පදය සිය කාව්‍ය කරණයේදී බහුලව භාවිත කළ අතර සඳකිඳුරු දා කවියා ද සිව්පද කාව්‍ය ආකෘතිය ප්‍රිය කළ බව පෙනේ.

## ජනකාව්‍ය සම්ප්‍රදායෙන් පෝෂණය වූ කෝට්ටේ යුගයේ පද්‍ය සාහිත්‍යය

ක්‍රි. ව. 8, 9, 10 යන සියවස්වල සීගිරි පද්‍ය සාහිත්‍යයේ ජන කාව්‍ය සම්ප්‍රදායේ බලපෑමෙන් තරමක් දුරට හෝ විද්‍යමාන වූ දේශීය පද්‍ය සම්ප්‍රදායක මං සලකුණු සංස්කෘත අලංකාරවාදී විචාර සම්ප්‍රදායේ බලපෑමෙන් වෙනස් ව අනුකාරක පද්‍ය සාහිත්‍යයක් බවට පත් වන අයුරු මුවදෙව්දාවත, සසදාවත හා කව්සිළුමිණයන ගී කාව්‍ය ග්‍රන්ථයන්ගෙන් පැහැදිලි වේ.[41] එම අනුකාරකත්වයෙන් මිදුණු සිංහල පද්‍ය සම්ප්‍රදායක් නැවත වරක් විද්‍යමාන වන්නේ දඹදෙණි යුගයෙන් පසුවය. ජනකාව්‍ය සම්ප්‍රදායේ බලපෑමෙන් මතුවී එන එම සම්ප්‍රදාය ගම්පොළ යුගයේ දී රචනාවනසන්දේශ කාව්‍ය සමග වර්ධනය වෙයි. කෝට්ටේ යුගයේ දී නව ප්‍රවණතාවක් ලෙස සෑම පද්‍ය සාහිත්‍ය ප්‍රවර්ගයකම පාහේ ජන කාව්‍ය සම්ප්‍රදායේ බලපෑම පැහැදිලි ලෙස අධ්‍යයනය කළ හැකිය.කාව්‍යශේඛරය, ගුත්තිල කාව්‍යය, බුදුගුණ අලංකාරය, ලෝවැඩ සඟරාව ආදී කෝට්ටේ යුගයට අයත් පද්‍ය සාහිත්‍ය තුළ දැකිය හැකි මෙම කාව්‍ය සම්ප්‍රදාය

උගත් නූගත් සැමට රසවිඳිය හැකි පද්‍ය සම්ප්‍රදායක් නිර්මාණය කිරීමට ඒ අනුව කෝට්ටේ යුගයේ පද්‍ය රචකයන් සමත් වෙයි.[42] දඹදෙණි යුගයේ ගීකාව්‍ය සම්ප්‍රදායේ අවසානයත් සමග ආරම්භව කෝට්ටේ යුගයේ වඩාත් ප්‍රචලිත වන ජනකාව්‍ය සම්ප්‍රදායේ ආභාසයෙන් ආරම්භවන නව පද්‍ය සම්ප්‍රදාය ජනකාව්‍ය ලක්ෂණ රාශියකින් පෝෂණය වී තිබේ.

කෝට්ටේ යුගයේ පද්‍ය කරුවන් පද්‍ය කරණයේ දී භාවිත බස් වහර, නිර්මාණාත්මක ස්වරූපය හා කාව්‍ය ආකෘතිය ජනකාව්‍ය සම්ප්‍රදායේ ආභාසයෙන් සකස් වූවකි. කෝට්ටේ යුගයේ බස් වහර ජනකවීන්ගේ බසට ඉතා සමීප බසක් බව කෝට්ටේ යුගයේ විසූ රාහුල හිමි, වෑත්තෑවේ හිමි වැනි කවියන් විසින් රචිත කාව්‍ය ග්‍රන්ථ සාක්ෂි දරයි. කෝට්ටේ යුගයේ ප්‍රබලම හා ප්‍රසිද්ධම කවියා වූෂට්භාෂා පරමේශ්වර යන ගෞරව නාමයෙන් පිදුම් ලද තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ පද්‍යවල පවා ජන ජීවිතයෙහි සිදුවීම් හා ඊට සරිලන භාෂාව නිරායාසයෙන් මෙන් යෙදුණු තැන් දැකිය හැකිය. විශේෂයෙන් ගතානුතගතික සකු වර්ණනාවලින් හෙම්බත්ව සිටි පාඨකයාට උන්වහන්සේගේ කාව්‍යශේඛරය නවමු රසයක් හා අත්දැකීමක් ලබා දෙයි. කාව්‍යශේඛරය රචනයේදී සාම්ප්‍රදායික වර්ණනාවලින් මිදී කතුවරයාගේ අද්දැකීම් යන්තමින් හෝ මුසු කරමින් උයන් හා දිය කෙළි වර්ණනා, රාජ සභා වර්ණනා හා යුද්ධ වර්ණනා ආදිය කාව්‍යශේඛර මහා කාව්‍යයට ඇතුළත් කරයි. කාව්‍යශේඛරයේ දසවැනි සර්ගයෙහි මහලු බමුණත්, තරුණ බිරියත් යන දෙදනාගේ හැසිරීම නිරූපණයෙහි ජනකවි බසත් ජන කවි සන්දර්භයත් තරමක් දුරට බලපා ඇති බව පෙනේ.[43]

''අතු පතර කපමින්
මොර කන්නවුන් විලසින්''[44]

''සිතුවිලි සිතා ගෙන
නුවනින් කඳුළු බා ගෙන
දුකෙකැයි කියා ගෙන
වැතිර ගත්තී කුද ගසා ගෙන''[45]



''කෙඳිරි පරගා නී
ඇති සිත ඉඟි නොපා නී
පෑ ආනි බා නී
කියා එබසට බැමිණි ගෑ නී''[46]

ගැමි ගෙදරක සිදුවිය හැකි සිදු වීමක් විසිතුරු සිතියමකට නගන රහල් හිමි එම අවස්ථාව ඉතා ව්‍යක්ත ලෙස නිරූපණය කිරීම සඳහා පොදු ජන වහරින් ලබන පිටුවහල කොතරම් සම්පූර්ණ ලෙස ලබා ඇද්ද යන්න තේරුම් ගත හැකි ය. ධ්වනිතාර්ථ නගා ශබ්දයන් ළං ළංව යෙදීමෙන් ලබන විශේෂාර්ථයත් හා පද වැලත් නිසා මෙහි අගය චමත්කාර ජනක ලෙස වැඩි දියුණු වී ඇත.

කෝට්ටේ කාලයේ කවියන් අතර වීදාගම හිමියන් රහල් හිමියන් තරමටම ප්‍රසිද්ධ කවියෙකි. මිථ්‍ය දෘෂ්ටීන් දුරු කොට ධර්මය පිළිබඳ නිවැරදි අවබෝධය ලබාදීම සඳහා පද්‍ය කරණයේ නිරත වූ උන්වහන්සේ සමාජයේ පැතිර පැවති අන්‍ය ලබ්ධි විවේචනයට සිය පද්‍ය යොදා ගන්නා ආකාරය අධ්‍යයනය කළ හැකිය. උන්වහන්සේගේ කාව්‍ය කරණයේ ස්වාධීනත්වය හා ශක්තිය බුදුගුණාලංකාරයෙන් ඉස්මතු වී පෙනෙයි. සාම්ප්‍රදායික නීතිරීති පසෙක දා ගැමි වහරින් හා ජනකවියෙන් පෝෂණය ලබා දෙන ඒ හිමියෝ බුදුගුණාලංකාරය ආරම්භයේදී ම තම ස්වාධීනතාව හෙළි කරති.

''කය නම් අසාරය
බව නම් භයංකාරය
කියනුව දිවා රැය
කෙරෙම් බුදු ගුණ අලංකාරය''[47]

පණ්ඩිත ප්‍රිය කාව්‍ය නීති ඉක්මවා යන මේ කවියා පොදු ජනතාවට කියවා රසවිඳිය හැකි කෘතියක් සේ බුදුගුණ අලංකාරය රචනා කරයි,

බුදුගුණ අලංකාරයේ එන විශාලා මහනුවර තුන්බිය පිළිබඳ වර්ණනයේ දී වීදාගම හිමියන් පොදු ජන වහරත් ජනකවි

''එසේ උවහොත් හි මි
ඔහුට මම අතවැසි වෙ මි
මෙම්ල ආපසු දෙ මි
මමත් ඔබ යනකල සමග යෙ මි''[50]

ගුත්තිල කාව්‍ය කොතෙක් කියවා රස වින්ද ද නැවත කියවන විට නවමු අත්දැකීමක් පාඨකයාට සමීප කර වීමට සමත් වෙයි. එහි අනායාසයෙන් ගලා යන කාව්‍යාත්මක වාග්මාලාව ඊට ප්‍රධාන සාධකයයි. එයජනකවියේ ආභාසයෙන් කවියා ඇති කර ගත්තකි. එහි අන්තර් ගත සෑම වර්ණනයකින්ම එය විද්‍යමාන වන අතර එයින් කවියාගේ සහජ ප්‍රතිභා ශක්තිය හා වචන පරිශීලන කුශලතාව මැනවින් පිළිබිඹු වේ.

ජනකාව්‍යයේ විද්‍යමාන බැවහැර බසට වැත්තෑවේ හිමියන් බොහෝ ළංවන අවස්ථාවක් ලෙස වීණා ශිල්පය ඉගෙන ගැනීමේ අරමුණින් ගුත්තිලගේ නිවසට ගිය මූසල ගුත්තිල පඬිතුමාගේ වීණාව වාදනය කළ අවස්ථාවේ දෙමාපියන්ගේ මුවින් පිට වීමට සලස්වන ලද වදන් පෙළ දැක්විය හැකිය. එම වදන් ගැමියකුගේ මුවින් පිටවන වදන් පෙළකට වඩාත් සමීප වෙයි.

''අඳ මව්පිය දෙදෙ න
ඔහු වයන බව නොම දැ න
කතී වෙන මී ය න
සූසූයයි අත ගැසූ සැක යෙ න''

''සගය ඒ ඇදු රා
කිසි කාරියක නුදු රා
ගියෙය නොව බැහැ රා
කිවුය දැන් දැන් එතියිඉදු රා''[51]

ඇතැම් වර්ණනාවන්වලදී කවීන් සංස්කෘත පද්‍ය කාව්‍ය ක්ෂේත්‍රයෙහි වැනුම් මග අනුගමනය කළ ද එවන් අවස්ථාවල දී වැත්තෑවේ හිමියන් එවැන්නකින් කිසිවක් ණයට ගෙන නැතයි



චාල්ස් ගොඩකුඹුර මහතා ප්‍රකාශ කරයි.[52] ගුත්තිල කාව්‍යයේ බස්වහර හා පද මාලාව ගැමි ජන වහරින් ඉතා පොහොසත් නොවූබසත් රීතියත් සන්දර්භයත් සකස්කර ගැනීමේ දීජනකවි සම්ප්‍රදායට බොහෝ සමීප වී ඇත. ගුත්තිල කාව්‍ය ජනකවි සන්දර්භයේ හා රීතියේත් රාජ සභා කාව්‍ය රීතියේත් යන අංගයන්ගේ සංකලනයෙන් නිපන්නක් බව මාර්ටින් වික්‍රමසිංහ මහතා කියයි.[53]

සිංහල කාව්‍ය නව මුහුණුවරකට නතු කිරීම සඳහා දිරිගත් කවියන් අතර පැරකුම්බා සිරිත් කතුවරයාද අමතක කළ නොහැක්කේ ය. පාලි සංස්කෘත වදන් පවා කවියෙහි යෙදීමෙන් නව මගක් ගත් හේ කාව්‍ය රීතිය විසින් ද වෘත්ත හා වදන් විසින් ද ජනකවි සම්ප්‍රදාය අනුගමනය කළ කවියෙක් බව විද්වතුන්ගේ අදහසයි.

කෝට්ටේ යුගයේ වඩාත් ජනප්‍රියම සාහිත්‍යාංගය වන්නේ සන්දේශ කාව්‍යයි. සමස්තයක් ලෙස කෝට්ටේ යුගයේ අනෙකුත් සාහිත්‍ය කෘතිවල විද්‍යමාන වූ ජනකාව්‍ය සම්ප්‍රදායේ ආභාසයෙන් සන්දේශ කාව්‍ය රචකයාටද මිදීමට නොහැකි විය. සන්දේශයේ ඇතම් යෙදුම් ජනකවි ඇසුරෙන් යොදා ගෙන ඇති බවට නිදසුන් දෙන පද්‍ය ඉන් උපුටා දැක්විය හැකි ය.

''මුනි තුන්තරා ගමනක් වැඩි සිරි ලකට
මතු අන්තරා හැර යක් සෙනගදුරු කොට''[54]

මීට අමතරව උපදේශ කාව්‍ය ප්‍රවර්ගයට අන්තර් ගත කළ හැකි වීදාගම හිමියන්ගේ ලෝවැඩ සඟරාව ඇතුළු සියලු සාහිත්‍ය නිර්මාණ ජනකාව්‍ය සම්ප්‍රදායේ ආභාසය අඩු වැඩි වශයෙන් ලබා ගෙන රචනා කෙරෙයි. ඒ අනුව කෝට්ටේ යුගයේ සිංහල පද්‍ය රචකයන් සාම්ප්‍රදායික නීතිරීතිවලට සිර වී පැවති සිංහල පද්‍ය සාහිත්‍ය ජනකාව්‍ය සම්ප්‍රදායේ ආභාසය ලබමින් ජනකාව්‍ය රීතියත් ව්‍යවහාර බසත් උපයෝගී කර ගනිමින් වන මාවතකට ප්‍රවේශ කළ අයුරු අධ්‍යයනය කළ හැකිය.

සම්ප්‍රදායත් පිළිබඳ මනා අවබෝධයකින් සිය කාව්‍ය කරණයට යොදා ගෙන ඇති බව පෙනේ.

''ගොඩ ගොඩ ඇට සැකිලි
තැන තැන තිබූ බලි බිලි
මඟ මඟ රෙදි වැරලි
එපුර ඇමතැන බලන් පිළිකුලී''[48]

''දොර දොර මිනී බෙර
ගෙයි ගෙයි හඬන බියකර
පිළ පිළ අදින මර
දුගී ගිලනුන්ගෙන් නැවත සර''[49]

වීදාගම හිමියන් දක්වන මෙම විස්තරය ගැමියකු එම ව්‍යසනය පිළිබඳ තවත් ගැමියෙකුට පවසන ස්වභාවය ගන්නේය.

කෝට්ටේ යුගයේ ප්‍රතිභා සම්පන්න සෑම කවියෙක් ම ජනකවියෙන් ආභාසය ලබා වියත් බසක් සකස් කර ගනිමන් ඉතා අගනා කෘති සැපයීමට සමත් වූහ. ඒ අතර ගුත්තිල කාව්‍ය උසස් තැනක් ගනියි. වෑත්තෑවේ හිමියන් ද ගැමි කවි බසේ ඕලාරික බව ඉවත් කොට ඊට කිසියම් වියත් ස්වරූපයක් ආරූඪ කරමින් සිය කාව්‍ය භාෂාව සක්ස් කර ගනියි. ජනකාව්‍ය සම්ප්‍රදායත් ගැමි බසත් අනුව නව කාව්‍ය සම්ප්‍රදායක් ගොඩනගා ගැනීමේ ව්‍යායාමය දඹදෙණි යුගයෙන් පසු ආරම්භ වුවත් එම ව්‍යායාමය ඉතා සාර්ථකව ගොඩ නඟා ගන්නා ලද්දේ වෑත්තෑවේ හිමියන් විසින් ගුත්තිල කාව්‍යයේ දීය. අනෙකුත් සාහිත්‍ය කෘතීන්හි භාෂාව සමග තුලනය කරන විට ගුත්තිලය බස නසා විවරණය මරා කළ කෘතියක් නොවේ. වියරණයත් බසත් රැක ගනිමින් රචිත ගුත්තිල කාව්‍යයේ බස්වහර හා පද මාලාව ගැමි ජන වහරටසමීපව ඉතා සාර්ථකව නිර්මාණය කර ගනියි. සිතේ හටගන්නා සිතුවිලි අව්‍යාජව කටට හුරු බසින් කියන ගැමියකුගේ ස්වරූපයක් මූසිල විසින් කරනු ලබන පහත ප්‍රකාශයෙන් පැහැදිලි වේ.



කෝට්ටේ යුගයේ දී සිංහල කවියේ කාව්‍ය ආකෘතිය සකස්වීමට ජනකාව්‍ය සම්ප්‍රදාය බලපා ඇති බව පෙනෙයි.[55] ජනකවියා විසින් භාවිත එළිසම සහිත සරල සිව්පද කාව්‍ය ආකෘතිය කෝට්ටේ යුගයේ සන්දේශ කාව්‍ය ඇතුළු පද්‍ය බොහෝමයක කාව්‍ය ආකෘතිය විය. සීගිරි පද්‍ය අතර තැනින් තැන විද්‍යමාන වූ මේ කාව්‍ය ආකෘතිය ඉන් පසුව සකු අලංකාරවාදී සාහිත්‍ය විචාරයේ බලපෑමෙන් ගී කාව්‍ය ආකෘතිය මූලික කර ගනිමින් ඇතිවූ සිංහල කාව්‍ය සම්ප්‍රදාය නිසා සම්පූර්ණයෙන්ම යටපත් විය. දඹදෙණි යුගයෙන් පසු ජනකාව්‍ය සම්ප්‍රදායේ ආභාසයෙන් නැවතත් දේශීය කාව්‍ය සම්ප්‍රදායක් ඉස්මතු වීමත් සමග සිව්පද කාවය ආකෘතිය වඩාත් ප්‍රචලිත වෙයි. මෙම කාව්‍ය ආකෘතිය කෝට්ටේ යුගයේ කවියන්ගේ ප්‍රධාන කාව්‍ය ආකෘතිය බවට පත් විය. විශේෂයෙන් කාව්‍යශේඛරය, ගුත්තිලය, බුදුගුණ අලංකාරය අදී කවියන් වැඩි දෙනෙක් මාත්‍රා 9, 11, 9, 14 යන මහපියුම් විරිත නමින් හඳුන්වනගී විරිතට අනුව කළඑළිසම පද්‍ය ආකෘතිය භාවිත කරයි.[56] ශබ්ද ධ්වනියක් නොනඟන, විරිතකින් තොර වූ කවිය, කවියක් නොවේ යයි යන මතය අප අතරට ආවේ කෝට්ටේ යුගය තුළ දී ජන කවිය ඇසුරෙන් ලබන ලද මේ පරිණාමය නිසා බව ගුණදාස අමරසේකර මහතා ප්‍රකාශ කරයි.[57]

## නිගමනය

සිංහල පද්‍ය සම්ප්‍රදාය ජනකාව්‍ය සම්ප්‍රදාය හා සම්භාව්‍ය කාව්‍ය සම්ප්‍රදාය යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වේ. සම්භාව්‍ය සිංහල පද්‍ය සම්ප්‍රදාය ආරම්භ වීමට බොහෝකලකට පෙර මෙරට ජනකාව්‍ය සම්ප්‍රදාය ආරම්භ වී ඇති බව අධ්‍යයනය කළ හැකිය. එම පද්‍ය සම්ප්‍රදාය මිනිසුන්ගේ සිතුම් පැතුම් අනුව රචිත එයටම ආවේණික වස්තු විෂයකින්, භාෂාවකින්, රචනා ශෛලියකින්, විරිතකින්, හා පදමාලාවකින් සමන්විත දේශීය පද්‍ය සම්ප්‍රදායකි. පසුකාලීනව සංස්කෘත භාෂා සාහිත්‍යයට හා අලංකාරවාදී විචාර කලාවන්ට උගතුන්ගේ ප්‍රමුඛ තැනක් ලැබීම නිසා ජනකාව්‍යසම්ප්‍රදාය මත පදනම් වූ දේශීය පද්‍ය සම්ප්‍රදාය ක්‍රමයෙන් යටපත් වී සංස්කෘත අලංකාර මත පදනම් වූ සම්භාව්‍ය

පද්‍ය සම්ප්‍රදායට ප්‍රමුඛ තැනක් හිමි විය. එහෙත් එම පද්‍ය සම්ප්‍රදාය දේශීය මිනිසුන්ගේ ජීවිතය හා සමාජය සමග බද්ධවූ සාහිත්‍යයක් නොවීය.

ජනකාව්‍ය සම්ප්‍රදායෙන් ආභාසය ලබා සකු අලංකාරවාදී කාව්‍ය විචාර සංකල්පයන්ගෙන් තරමක් දුරට හෝ මිදුණු, දේශීය මිනිසුන්ගේ ජීවිතය හා සමාජය සමග බද්ධ වූ නව කාව්‍ය සම්ප්‍රදායක් නැවත ඇති වන්නේ දඹදෙණි යුගයෙන් පසුවය. විද්වතුන්ගේ මතය අනුව එම නව සම්ප්‍රදායේ ආරම්භක කෘතිය ලෙස කෝට්ටේ යුගයට පෙර රචනා වූ විල්ගම්මුල හිමියන්ගේ සඳකිඳුරු දා කව ගත හැකිය. නමුත් සඳකිඳුරු දා කව නිශ්චිතව රචනාවූ කාලය පිළිබඳ සඳහන් කළ නොහැකි බැවින් දඹදෙණි යුගයෙන් පසුවන පද්‍ය සම්ප්‍රදාය ආරම්භ වන බවත් කෝට්ටේ යුගයේ දී මෙම නව මුහුණුවර හෙවත් නව සම්ප්‍රදාය වඩාත් තහවුරු වන බවත් නිශ්චිතව සඳහන් කළ හැකිය. ඒ අනුව කෝට්ටේ කාලය අවසන් වූයේ ජනකවි පිළිබඳ සැහෙන පදනමක් සිංහල කාව්‍යයෙහි බිහි කොට ය. මෙම නව පියවර ජනකවිය පිළිබඳ කවියන් පොළොඹවන්නක් වී ය. එතැන් පටන් ගෙන කවියන් වැඩි දෙනෙකුම ජනකවි මඟ ගෙන තම කාව්‍යයන් නිර්මාණය කරන්නට වීම නිසා මහනුවර යුගය වන විට සිංහල කාව්‍ය වංශයම විවිධත්වයෙන් හා සංකීර්ණත්වයෙන් පැතිරි ගිය පද්‍ය සාහිත්‍යයක් බවට පත් විය.

## ආන්තික සටහන්

1. රත්නපාල, ඊ. ඇම්. ජන ජීවිතය, ජනශ්‍රැතිය හා රයිගම. කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1991, පිටුව09.
2. අත්තනායක හේරත්, එම්. සිංහල කාව්‍ය සංග්‍රහය - මීමංසා. වරකාපොල, ආරිය ප්‍රකාශකයෝ, 1989, පිටුව 33.
3. අස්සජි හිමි, තල්පේ. ජනකවිය දෙවියෝ සහ යක්ෂයෝ. කොළඹ 10, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 1998, පිටුව20.
4. විමල් සිරිසේන ඒ. ඇල්. ගැමි සාහිත්‍ය විචාරය .කොළඹ, ඇම්. ඩී. ගුණසේන සමාගම, 1963 පිටුව 01.
5. සුමංගල හිමි, සූරයගොඩ, හේවා විතාරණ සයිමන් (සංස්), සාරත්ථප්පකාසිනී. කොළඹ, 1920 පිටුව 211.
6. අස්සජි හිමි, තල්පේ, 1998, පිටුව 17.



7. එම, පිටුව 20.
8. මහගම සේකර, සිංහල ගද්‍ය පද්‍ය නිර්මාණයන්හි රිද්ම ලක්ෂණ. කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ 2001, පිටුව 84.
9. එම, පිටුව 21
10. එම, පිටුව 84.
11. අස්සජි හිමි, තල්පේ, 1998, පිටුව 17.
12. සුමංගල හිමි, හික්කඩුවේ, ගුණවර්ධන බටුවන්තුඩාවේ (සංස්), මහා වංශය. 1908, පරි. 41, ගාථා. 13.
13. චාල්ස් ගොඩකුඹුර, සී. ඊ. සිංහල සාහිත්‍යය. කොළඹ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 1999, පිටුව 153.
14. ඥානසීහ, හේන්පිටගෙදර (සංස්) සියබස්ලකර. මාලිගාකන්ද, එච්. කේ. ඩී. චන්ද්‍රසේන සහ පුත්‍රයෝ, 1964, පිටුව 2.
15. මහගමසේකර, 2001, පිටුව 156.
16. අමරසේකර, ගුණදාස සිංහල කාව්‍ය සම්ප්‍රදාය, බොරලැස්ගමුව, විසිදුනු ප්‍රකාශකයෝ, 1998, පිටුව 35.
17. paranavitana,Senarath' **Sigiri Graffiti" Published for the Government of Ceylon"** By Geoffrey" Cambridge Oxfordn University Press" 1956" Vol" I p' VIII
18. අස්සජි හිමි, තල්පේ 1998, පිටුව 18.
19. මුදියන්සේ, නන්දසේන, සීගිරි පද්‍යාවලිය. කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. 2004, පිටුව 64.
20. අස්සජි හිමි, තල්පේ, 1998, 1998, පිටු 18 - 19.
21. ඥානාලෝක හිමි කෝදාගොඩ (සංස්), සිදත්සඟරා පුරාණ සන්නය. හේමචන්ද්‍ර වී ගුණසේකර, 1997, පිටුව 250.
22. අමරසේකර, ගුණදාස 1998, පිටුව 48.
23. කුරේ,එන්. ඊ. පුරාණ යශෝදරාවත. ඩියුත් මුද්‍රණාලය, 1968, පිටුව 6.
24. මුදියන්සේ, නන්දසේන. 2004, පිටුව 19.
25. එම ,පිටුව 155.
26. එම, පිටුව 196.
27. වික්‍රමසින්හ, මාර්ටින්, සිංහල සාහිත්‍යයේ නැගීම. දෙහිවල, සීමාසහිත තිසර ප්‍රකාශකයෝ, 1997, පිටුව 80.
28. ඥානසීහ, හේන්පිටගෙදර (සංස්), 1964, පිටුව 02.
29. වික්‍රමසිංහ, මාර්ටින්. 1997, පිටුව 81.
30. අමරසේකර, ගුණදාස, 1998, පිටුව 105.
31. සන්නස්ගල, පී. බී. සිංහල සාහිත්‍ය වංශය. කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2013, පිටුව 371.
32. අමරසේකර, ගුණදාස 1998, පිටුව 108.
33. එම, පිටුව 178.
34. සිරි තිලකසිරි, සඳකිඳුරු දා කව, කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2005, පිටුව xvii
35. පී. බී. සන්නස්ගල, 2013, පිටුව 258.
36. සිරි තිලකසිරි, 2005, පිටුව l iv
37. සී. ඊ. චාල්ස් ගොඩකුඹුර, 1999,පිටු 176-177
38. සිරි තිලකසිරි, 2005, පිටුව 37
39. එම, පිටුව 45.
40. එම, පිටුව 47.
41. ගුණදාස අමරසේකර, 1998, පිටුව 53.

42. එම, 1998, පිටුව 103.
43. සිරි තිලකසිරි, 2005, පිටුව liv
44. ආර්.ඒ. ලියනආරච්චි, කාව්‍යශේඛර මහා කව්‍යය, කොළඹ 10, 2007, පිටුව 283.
45. එම, පිටුව 360.
46. එම, පිටුව 361.
47. නන්දසේන රත්නපාල, බුදුගුණ අලංකාරය. කොළඹ 10, රත්න පොත් ප්‍රකාශකයෝ, 1978, පිටුව 01
48. එම, පිටුව 07.
49. එම, පිටුව 07.
50. ඩබ්. ඇෆ්. ගුණවර්ධන, ගුත්තිල කාව්‍ය වර්ණනා. කර්තෘ ප්‍රකාශන, 1959, පිටුව 116.
51. එම, පිටුව 119.
52. සී. ඊ. චාල්ස් ගොඩකුඹර,1999,පිට 172.
53. මාර්ටින් වික්‍රමසිංහ, 1997, පිටුව 280.
54. කුමාරතුංග මුනිදාස, ගිරා සන්දේශ විවරණය. කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2002, පිටුව 39.
55. ගුණදාස අමරසේකර, 1998, පිටුව 106
56. සිරි තිලකසිරි, 2005, පිටුව xxix
57. ගුණදාස අමරසේකර, 1998, පිටුව 106